# හද විදවන මතක සුවඳ



14

විප්ලවවාදී සගයින් අතර තද බැඳීමක් හා මිත්‍රත්වයක් පැවතිය යුතු බව 'චේ ගෙවාරා' සහෝදරයා පවා විශ්වාස කළ දෙයකි. ලෝකයේ පවත්නා සෑම සියලු දෙයකම විවිධත්වයක් හා ඒවාට ආවේණික ගති ලක්‍ෂණ ඇති පුද්ගලයෝ උන්හ. ජනතා විමුක්ති පෙරමුණට ද එම තත්ත්වය පොදු විය. මිත්‍රත්වයෙන් ඇසුරු කළ හැකි සොයුරන් ද, එසේ සමීප විය නොහැකි 'සීරියස්' සොයුරන් හෙවත් නෑයන් ද සිටියහ. දහනායක සොයුරා විහිළුවට තහළුවට ළැදි මිත්‍රත්වයෙන් ඇසුරු කළහැකි වර්ගයේ සොයුරකු විය.

දහනායක කෙරෙන් දිස්වූයේ ලන්සියෙකුගේ හෙවත් බර්ගර් ජාතිකයෙකුට සමාන කළහැකි පෙනුමකි. බළල් ඇස් දෙකක් හා ළා රතට හුරු හමක් තිබූ ඔහුගේ අත් දඬු දෙකේ වූ මවිල් පවා තඹවන් පාටින් දිළිසුණි. අවශ්‍ය පමණට උස මහත ඔහු බැලූ බැල්මට ජව සම්පන්නය. ශක්තිමත්ය. 'දහ' හිනාවෙන විට ඇස්දෙක පියවී යන තරමට හැකිලී කුඩා වෙයි.

මට දහනායක සොයුරා සිහිපත් වෙන හැම වාරයකම වගේ උසාවියට, නීතියට, අධිකරණ වෛද්‍ය නිගමනවලට අදාළ මෙම විශේෂ කථාව ද සිහිපත් වෙයි.

මා බන්ධනාගාරගතව සිටි එක් වාරයක 'දහ' ද හිරගෙදරට අවුත් සිටියේ ය. එවර මා සිටියේ තවත් සොයුරන් හය දෙනෙකු සමඟ දේශපාලන හේතූන් මතය. 'දහ' උන්නේ මිනීමැරුමක සැකකරු වශයෙනි. ඔහු සමඟ 'හිච්චි මල්ලී' නම් ළාබාල ගැටවරයෙකු ද සිරගතව සිටියේ ය. එහෙත් ඔහු තම වයසට වඩා උස් මහත් වූ හැඩි දැඩියෙකි. අප සියලු දෙනාම රඳවාගෙන සිටියේ දැල් වාට්ටුවේ ය. මාතර බන්ධනාගාරයේ අනික් වාට්ටුවලට පවතින උෂ්ණත්වය හා සසඳා බලන කල තුන් පැත්තකටම යකඩ දැල් ගසා ඇති දැල් වාට්ටුවේ රැඳී සිටීමත් තරමක වරප්‍රසාදයක් වැනිය.

දහනායකටත්, හිච්චි මල්ලීටත් තිබූ චෝදනාව කෝලාහලයකදී කඩුවකින් බෙල්ලට ගසා මිනිසෙකු මැරීම ය. එම මිනිසා මැරී තිබුණේ බෙල්ලට වැදුණු එකම එක කඩු පහරකිනි. නඩු භාණ්ඩ වශයෙන් එම කඩුපත උසාවියට ඉදිරිපත් කර තිබේ. මරණකරුට මොවුහු කඩුවෙන් කොටනු දුටු බව ඇසින් දුටු සාක්ෂිකරුවන් ද සාක්ෂි දෙන්නට ඉදිරිපත්ව සිටිති. ඉදින් බැලූ බැල්මට මෙය චෝදනා ඔප්පු වන නඩුවකි. දහ හා හිච්චි මල්ලි එල්ලුම් ගස් යන්නට හෝ ජීවිතාන්තය දක්වා හිරගතවීමට සිද්ධවන නඩුවකි. එහෙත් දහ හිටියේ කිසිම තැතිග උන්මකින් තොරව ඉතාම සැහැල්ලුවෙනි.

දිනක් දහත්, මමත්, හිච්චි මල්ලීත් බන්ධනාගාරයේ මිදුලට වී කථාබහ කරමින් සිටිනවිට මම හිච්චි මල්ලිට මෙසේ පැවසීමි.

"හිච්චි මල්ලී, තමුසෙගේ මුණේ තියෙන්නේ මහ මිනීමරු පෙනීමක්, මට විශ්වාසයි තමුසෙ තමයි අර මිනිහව

**"ඔහේ හිච්චි මල්ලිට අර විදිය කියන කොට මට හිනාව නවත්ත ගන්න බැරි උනා. ඇත්තටම ඒ වැඩේ උනේ හිච්චි මල්ලි අතින් තමයි. හිච්චි මල්ලිගේ ඉඩම් ප්‍රශ්නයකට ඒ මිනිස්සු මූට වටකරලා ගහන්නයි හැදුවේ. ඇත්තටම මම ගියෙ රණ්ඩුව බේරන්න. හිච්චි මල්ලි කඩුව අරගෙන වටේට කරකැව්වා. එතකොට කඩුවෙ තුඩ එකෙකුගෙ ' බෙල්ලේ, හරියටම උගුරුදණ්ඩේ වැදුණා. ඒ මිනිහා එතැනම වැටිලා මළා. පස් දෙනෙක්ම සාක්ෂි දෙනවා කඩුවෙන් බෙල්ලට ගහලා මැරුවයි කියලා....."**

මැරුවේ."

මා විහිළුවට මෙන් එසේ පැවසූ කල දහනායක බඩ අල්ලාගෙන සිනාසුණේ ය. පසුව මා පමණක් සිටින වෙලාවකදී මෙසේ කීවේ ය.

"ඔහේ හිච්චි මල්ලිට අර විදිය කියන කොට මට හිනාව නවත්ත ගන්න බැරි උනා. ඇත්තටම ඒ වැඩේ උනේ හිච්චි මල්ලි අතින් තමයි. හිච්චි මල්ලිගේ ඉඩම් ප්‍රශ්නයකට ඒ මිනිස්සු මූට වටකරලා ගහන්නයි හැදුවේ. ඇත්තටම මම ගියෙ රණ්ඩුව බේරන්න. හිච්චි මල්ලි කඩුව අරගෙන වටේට කරකැව්වා. එතකොට කඩුවෙ තුඩ එකෙකුගේ බෙල්ලේ, හරියටම උගුරුදණ්ඩේ වැදුණා. ඒ මිනිහා එතැනම වැටිලා මළා. පස් දෙනෙක්ම සාක්ෂි දෙනවා කඩුවෙන් බෙල්ලට ගහලා මැරුවයි කියලා....."

"ඒ උනාට අධිකරණ වෛද්‍ය නිලධාරියා කියන්නේ මේ මරණය සිද්ධවෙලා තියෙන්නේ කඩුවක් වගේ බර ආයුධයකින් ගහපු පාරකින් උගුරුදණ්ඩ කැපීමෙන් නෙවෙයි දැලි පිහියක් වගේ තියුණු ආයුදේකින් කැපීම නිසාය කියලා. ඒ වගේම හිටගෙන ඉන්න මිනිහෙකුගේ බෙල්ල මේ විදියට කපන්න බැහැ. මරණකරු බිම වැටිලා ඉන්න මොහොතක දැලි පිහියෙන් උගුරුදණ්ඩ කපලා තියෙනවා කියලයි ඒ වාර්තාවේ තියෙන්නේ. ඉතින් සාක්ෂිවල තියන මේ පරස්පර බව නිසා අපි නිකම්ම නිසදහස් වෙන පාටක් තමයි තියෙන්නේ."

මිනීමැරුම් නඩුවකට ඇප ලැබෙන්නේ මාස පහක් හෝ හයක් රිමාන්ඩ් බන්ධනාගාරයේ තැප්පාට පසුව ය. මටත් සගයන්ටත් ඇප නියම වී අප නදහස් ව ගියේ දහනායකලා හිරගෙදර සිටියදී ය.

දහනායක සොයුරා නැවත මට හමුවෙන්නේ එයින් වසර හයකට පසුව ගාල්ලේ ලන්දේසි කොටුව ඇතුළතදී ය. ඔහුත් ගමගේ මල්ලීත් මට හමුවූයේ වසර ගණනකට පසුව වුණත් එය ආ ගිය කථාවේ යෙදී සිටීමට සුදුසු අවස්ථාවක් නොවී ය. පරණ ජේ.වී.පී. කාරයන් තිදෙනෙකු එකට එක් වී සිටින බව ඔත්තුකරුවෙකු දුටුවහොත් අප තිදෙනාගෙම ජීවිත අනතුරේ ය.

"සහෝදරයා හම්බ උනේ වාසනාවකට වගේ. ළඟ තියෙනවා නම් රුපියල් දහයක් දෙන්න. අතේ සතේ නෑ."

ගමගේ මල්ලි එසේ කී විට මම පුදුම වීමි. මගේ ළඟ තිබුණේම රුපියල් දහයකි. මා එය දුන් පසු වහාම මගෙන් සමුගත් ඔවුන් දෙදෙනා ඉක්මන් ගමනින් කොටු දොරකඩ ඇති දිශාවට ගියහ.

ජ.වි.පෙ හා දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ සමාජිකයන් කොටුකර ගැනීමට හමුදාව විසින් ඉතා සූක්‍ෂමව දැල එලමින් සිටි එම කාලයේ අතේ සතේ නැතිව එම සහෝදරයන් දෙදෙනා සිටියේ කොතරම් අවධානම්, අනාරක්ෂිත තත්වයක ද ? අතේ මුදල් නැතිව ඔවුන් බසයක දුම්රියක යන්නේ කෙසේද ? ප්‍රවේශපත් නොගෙන බසයක හෝ දුම්රියක ගොස් අසුවී හෝ එසේ කරන්නට උත්සාහ කිරීම සැකයට භාජනය වන දෙයක් නොවෙද ? අන්ත්‍රාවට අත වැනීමක් නොවෙද ? පසුගිය සතියේදී ගාල්ල බස් නැවතුම් පොළ ඇතුළත් වන මුළු පෙදෙසම වටකළ හමුදාව සියලුම මඟීන් පෙළගස්වා ගෝනි බිල්ලන් කිහිප දෙනෙකු ඉදිරිපිටින් ගමන් කරවා සැක සහිත පුද්ගලයන් අත්අඩංගුවට ගත්හ. ළමා කාලයේදී සන්නාසි බිල්ලන්ට හා ගෝනි බිල්ලන්ට බිය වූ අපට වැඩිහිටියන් වූ පසුවද ගෝනි බිල්ලන්ට බියවීමට සිදුවීම දෛවය කරන ලද මහා සරදමක් වැනි විය.

තවත් දිනක පුද්ගලික බසයකට නැගී ගාල්ල බලා එමින් සිටි මට අසන්නට ලැබුණේ හමුදාව ගාල්ල බස් නැවතුම් පොළ වට කර ඇති පුවතය. අපගේ බස් රථයේ රියදුරුට එය පවසන ලද්දේ මාතර බලා යාමට ගාල්ල දෙසින් ආ බසයක රියදුරු ය. එම පුවත ඇසූ මා සම්බෝධි අනාථ නිවාසය අසලින් බසයෙන් බැස ගතිමි. වාසනාවට මෙන් එවෙලෙහිම මා අත මුදල් තිබුණෙන් කුලී කාරයකට නැගුණ මා කොටුව ඇතුළත වූ මගේ රැකියා ස්ථානයට ගියෙමි. හමුදාව බස් රථවල, වෑන් රථවල යන මිනිසුන් බස්සවා පරීක්‍ෂා කළ ද කාර්වල යන මිනිසුන් බැස්සුවේ නැත.

ඉදින් එම සහෝදරවරුන්ට ද එවැනි අවස්ථාවක මුහුණ දෙන්නට සිදු වුවහොත් ටැක්සි රථයක හෝ නැඟී මඟහැර යාමට මුදල් අත තිබිය යුතු නොවේද ?

දහනායක සහෝදරයා එසේ හමුවීමෙන් මාස දෙක තුනකට පසු මට ඔහු පිළිබඳ අසන්නට ලැබිණි. කඩවත ප්‍රදේශයේ පොලිස් මුර පොළකට පහර දී අවි ආයුධ පැහැර ගැනීමට කරන ලද උත්සහයකදී දහනායක සොයුරාට වෙඩි වැදී මිය ගිය බව එම දුක්මුසු පුවතයි.

පක්‍ෂයට අම්මලා බොහෝ දෙනෙකු හිටියත් තාත්තලා බොහෝ දෙනෙකු හිටියේ නැත. එය තව දුරටත් පැහැදිලි කරන්නේ නම් පක්‍ෂයට සිටි අම්මලා බොහෝ දෙනෙකු සිය කැපවීම් කරන ලද්දේ සිය නිවෙස්වලම රැඳී සිටිමිනි. පක්‍ෂයේ සහෝදරියන් සමඟ පාරට බැස මගතොට අවිදිමින් නොවේ. එහෙත් පක්‍ෂයට ලැදි තාත්තලාගේ කාර්යභාරය කැපී පෙණුනේ පක්‍ෂයේ සහෝදරවරුන් සමඟ පාරට බැස, සමාජය අතරට ගොස් වැඩ කිරීමෙනි.

වැලිගම අම්මාත්, තාත්තාත් පක්‍ෂයේ අන් අම්මලාගෙන් තාත්තලාගෙන් කැපී පෙණුනේ ඔවුන් දෙදෙනා සතුව තිබූ සුවිශේෂී බව නිසාවෙනි.

නාදුගල සුබේගේ (සුබසිංහ සහෝදරයාගේ) අම්මා, තල්පාවිල කුඹල්ගම අම්මා යන අම්මලා 'මක්සිම් ගෝර්කි' ගේ අම්මා සිහිපත් කරවන අම්මලා වූහ. මා මගේ 'කළු දුමාරය' කෘතියේ 'පරිත්‍යාගය' නම් වූ නව කතාව නිර්මාණය කරන ලද්දේ එම අම්මලාගෙන්ද, මේ කියන්නට යන අම්මා-ගේ ද මතක සුවඳ සංකලනය කර එක චරිතයකට කැටි කිරීමෙනි.

වැලිගම අම්මා විශ්‍රාම ගිය ගුරු මාතාවකි. ගම්මුන් ඇය හඳුන්වන ලද්දේ 'බැසිලින් ඉස්කෝලෙ හාමිනේ' හෝ 'බැසිලින් ටීචර්' යනුවෙනි. අම්මා කෙසඟය. හීන්දෑරිය. දුර්වලය. පසුවූයේ නිරෝගීව නොවේ. ඇය රෝගී තත්වයට ඇද වැටුණේද, අත් දෙක තරමක් අවසඟව ගියේද යම් අවාසනාවන්ත සිද්ධියකට මුහුණ පෑමෙනි.

'"අයියෝ අන්න කව්ද බැසිලින් ඉස්කෝලේ හාමිනේට කඩුවකින් ගහලා තුවාලයි." එම විලාපය කණ වැකෙන විට මිතුරන් කිහිප දෙනෙකු සමඟ මා හිටියේ මුහුදු වෙරළ මායිමේ වූ කළුගල් වැටිය මතය. අපි තානායම් හන්දිය හරහා මහා වීදියට දිව්වෙමු. එම මොහොතේම කව්දෝ විසින් ලේ වැකුණු සිරුරක් දෑතට ඔසවා ගෙනැවිත් කාරයක් තුළ තැන්පත් කළේ ය. එම ස්ථානයට එක්රොක්වී සිටි ගැහැනුන් හා ළමයින් හිස අත් බදාගෙන විලාප දිදී හඬා වැටුණෝ ය.

*ලබන කලාපයට*

රෝහිත මුණසිංහ
*ප්‍රංශයේ සිට*